1978 - 7 - 14

# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 24

# දරන රාජ්‍ය මුද්‍රණ සංස්ථා

# (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 ජූලි මස 3 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1978 ජූලි මස 07 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 30 යි　　　　තැපැල් ගාස්තුව : ශත 15 යි

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 24 දරන රාජ්‍ය මුද්‍රණ සංස්ථා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 ජූලි මස 3 වන දින]

එල්. ඩී.—ඕ. 54/77.

1968 අංක 24 දරන රාජ්‍ය මුද්‍රණ සංස්ථා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 24 දරන රාජ්‍ය මුද්‍රණ සංස්ථා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *(ලුහුඬු නාමය.)*

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1968 අංක 24 දරන රාජ්‍ය මුද්‍රණ සංස්ථා පනතේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— *(1968 අංක 24 දරන පනතේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.)*

*("සංස්ථාවේ පොදු පරමාර්ථ.)*

4. (1) පහත දැක්වෙන පරමාර්ථ සංස්ථාවේ පොදු පරමාර්ථ විය යුතු ය :—

(අ) ආණ්ඩුවට, පළාත් පාලන ආයතනවලට හෝ නීතියෙන් සංස්ථාපිත යම් රාජ්‍ය සංස්ථාවකට හෝ යම් නීතියකින් හෝ යම් නීතියක් යටතේ සංස්ථාපිත යම් මණ්ඩලයකට අවශ්‍ය වන්නා වූ යම් මුද්‍රණ වැඩක් හෝ යම් මුද්‍රණ හා ප්‍රකාශන වැඩක් කිරීම ;

(ආ) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් පෞද්ගලික ආයතනයකට හෝ පුද්ගලයකුට අවශ්‍ය වන්නා වූ යම් මුද්‍රණ වැඩක් හෝ යම් මුද්‍රණ හා ප්‍රකාශන වැඩක් කිරීම ;

(ඇ) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව සඳහා මුද්‍රණය කරන ලද හෝ ප්‍රකාශයට පත් කරන ලද පොත් හා ප්‍රකාශන හැර, සංස්ථාව විසින් මුද්‍රණය කරන ලද හෝ ප්‍රකාශයට පත් කරන ලද පොත් හා ප්‍රකාශන විකිණීම සහ බෙදා හැරීම භාර ගැනීම ; සහ

(ඈ) මෙහි මින් පෙර සඳහන් කරන ලද පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ ඊට ආනුෂංගික සියලු වෙනත් ක්‍රියා හෝ දේ කිරීම.

(2) (1) (ආ) වන උපවගන්තියේ සඳහන් කරන ලද කිසිම වැඩක්—

(අ) ඒ වැඩය, පාසැල් පාඩම් පොත් මුද්‍රණය කිරීම හා ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් බාධාවක් නොවන පරිදි ක්‍රියාත්මක කළ හැකි නම් මිස, සහ

(ආ) ඒ වැඩය භාර ගැනීම—

(i) සංස්ථාව භාරව සිටින අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් පත් කරන ලද ඒ සංස්ථාව භාර අමාත්‍යාංශයේ නිලධරයකු වන එක් සාමාජිකයකු ද ;

(ii) අධ්‍යාපන විෂයය භාරව සිටින අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් පත් කරන ලද ඒ අමාත්‍යාංශයේ නිලධරයකු වන එක් සාමාජිකයකු ද ; සහ

(iii) සංස්කෘතික කටයුතු පිළිබඳ විෂයය භාරව සිටින අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් පත් කරන ලද ඒ අමාත්‍යාංශයේ නිලධරයකු වන එක් සාමාජිකයකු ද

වශයෙන් සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත උපදේශක කමිටුවක් විසින් ලියවිල්ලකින් අනුමත කරනු ලැබුවහොත් **මිස,**

සංස්ථාව විසින් භාර ගනු නොලැබිය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (1) සංස්ථාවට—

(අ) ප්‍රවෘත්ති හා ගුවන් විදුලි විෂයය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු සාමාජිකයන් හතර දෙනකු ද ;

(ආ) අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු එක් සාමාජිකයකු ද ;

(ඇ) සංස්කෘතික කටයුතු පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු එක් සාමාජිකයකු ද ; සහ

(ඈ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු එක් සාමාජිකයකු ද

වශයෙන් සාමාජිකයන් හත් දෙනකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් තිබිය යුතුය. ".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියේ " අධ්‍යක්ෂවරයා " යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

' " රාජ්‍ය සංස්ථාව " යන්නෙන් සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් යම් ලිඛිත නීතියක් මගින් හෝ ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද ආණ්ඩුව විසින් සපයනු ලබන්නා වූ මුළු ප්‍රාග්ධනය හෝ ඉන් කොටසක් හෝ ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් ලබන්නා වූ ද යම් සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ. '.